**සාමාජිකයින්ට ප්‍රතිලාභ - නියමයන් හා කොන්දේසි**

**අර්ථ නිරූපණය**

1. සාමාජිකත්ව ප්‍රතිලාභ යනුවෙන් අදහස් කරන්නේ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් සුදුසුකම්ලත් කාඩ්පත් හිමියන්ට සලසා ඇති ඇමරිකන් එක්ස්ප්‍රස් සාමාජිකත්වය ප්‍රතිලාභ වැඩ සටහනයි. කාඩ්පත් සාමාජික යනුවෙන් අදහස් කරනු ලබන්නේ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් නිකුත් කරන ලද ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ්පතක් දරන්නාය "ඇතුලවීමේ දිනය" යනුවෙන් අදහස් කරන්නේ සමාජිකත්ව ප්‍රතිලාභ නිරන්තර නොවන මාර්ග මනාපය හෝ සමාජිකත්වය ප්‍රතිලාභ නිරන්තරම මාර්ග මනාපය යටතේ ඇතුලත් විමට අයදුම්පත බැංකුව වෙත ලැබෙන මාසයේ පළමුවන දිනය වේ. ඇතුලත් වීමේ වර්ෂය යනුවෙන් අදහස් කරන්නේ වැඩ සටහනට ඇතුලත් විමේ දිනයෙන් ආරම්භවන මාස 12 ක කාලපරිච්ඡේදය හා ඉන් අනතුරුව එලඹෙන එක් එක් මාස 12 ක කාල පරිච්ඡේදයන් අදහස් කරනු ලැබේ නිරන්තර සංචාරක වැඩ සටහන් යන්නෙහි අදහස් කරන්නේ සහභාගි වන ගෝලීය පාර්ශවකරු වැඩ සටහනකි. සංචාරක ප්‍රතිලාභ යනුවෙන් අදහස් කරනු ලබන්නේ වැඩසටහන මගින් නිරන්තර සංචාරක ප්‍රතිලාභ නිදහස් කර ගැනීමය නිරන්තර සංචාරක ප්‍රතිලාභ යනුවෙන් අදහස් කරන්නේ නිරන්තර සංචාරක වැඩසටහන් යන කලින් කලට එකතු කරනු ලැබිය හැකි වෙනත් එවැනි ප්‍රතිලාභ වලට ලකුණු (Porits) මාරු කිරීමෙන් ලබාගන්නා ප්‍රතිලාභයන්ය. "සම්බන්ධිත ගිණුම්" යනුවෙන් අදහස් කරනුයේ ලකුණු එකතු කර ගැනීමේ පරමාර්ථය සඳහා ප්‍රාථමික කාඩ්පත් දරන්නකු විසින් දරනු ලබන සුදුසුකම්ලත් සියලු ගිණුම්ය. 'නිරන්තර නොවන සංචාරක ප්‍රතිලාභ' යනුවෙන් අදහස් කරන්නේ ප්‍රතිලාභ හා සාප්පුයාම, ආහාරගැනීම, විනෝද ක්‍රිඩා මූල්‍ය සේවා ඇතුළුව නිරන්තර සංචාර ප්‍රතිලාභ හා දේශීය සංචාර අනන්‍ය පළපුරුදු ප්‍රතිලාභ හා කලින් කල එකතු කරනු ලැබිය හැකි වෙනත් එවැනි ප්‍රතිලාභ ඇතුලුව නිරන්තර සංචාර ප්‍රතිලාභ හැර වැඩසටහන මගින් සලසනු ලබන සියලු ප්‍රතිලාභයන්ය ලකුණු (Porits) යන්නෙන් අදහස් කරනුයේ සමාජිකත්වය ප්‍රතිලාභ ලකුණු වේ. වැඩසටහන් යනුවෙන් අදහස් කරන්නේ ඇමරිකන් එක්ස්ප්‍රස් සාමාජිකත්ව ප්‍රතිලාභ වැඩසටහන වන අතර නිරන්තර සංචාරක මනාපය හා නිරන්තර නොවන සංචාරක මනාපය යන දෙකම ඊට ඇතුලත් වේ වැඩසටහන් ගිණුම යන්නෙන් අදහස් කරනුයේ කාඩ්පත් සාමාජිකයකුගේ සමාජිකත්ව ප්‍රතිලාභ වැඩසටහනය.

2. **යොග්‍යතාවය හා ඇතුලත් කිරීම**

   2.1 නේෂන් ට්‍රස්ට් බැංකුව විසින් නිකුත් කරනු ලබන සියලු ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ්පත් සමාජිකයින්ගේ කාඩ්පත් පමණක් (ඇමරිකන් එක්ස්ප්‍රස් බ්ලූ ක්‍රෙඩිට් කාඩ්පත් හා නේෂන්ස් ට්‍රස්ට් බැංකු ජොන් කීල්ස් සමූහයේ සාම්‍යය කාඩ්පත් හැර) සාමාජිකත්ව ප්‍රතිලාභ වැඩසටහනට සහභාගිවීමට සුදුසුවෙති.

   2.2 සුදුසුකම් ඇති කාඩ්පත් සමාජිකයෝ ඇමරිකන් එක්ස්ප්‍රස් සාමාජිකත්ව ප්‍රතිලාභ නිරන්තර නොවන සංචාරක මනාපය හා නිරන්තර සංචාරක මනාපය යටතට ඉබේම ඇතුලත් කරනු නොලබති.

   2.3 24 පැය පුරා ක්‍රියාත්මක වන ක්ෂණික ඇමතුම් මාර්ගය (4414141) ඔස්සේ ඇමතීම මගින් කාඩ්පත් සමාජිකයින් විසින් ඇමරිකන් එක්ස්ප්‍රස් සමාජිකත්ව ප්‍රතිලාභ නිරන්තර නොවන සංචාරක මනාපය හා නිරන්තර සංචාරක මනාපය යටතේ ඇතුලත් වි යුතුය.

   2.4 ඇතුලත් කිරීමේ දිනයෙහිදී යහපත් ස්ථාවරයෙන් පවතින (උදා. යුතුකම් පැහැර නොහරින ගිණුම්) ගිණුම් පමණක් අතුලත් වීම සඳහා සුදුසු වෙති.

3. **ගාස්තු**

3.1 සාමාජකත්ව ප්‍රතිලාභ නිරන්තර සංචාරක ගිණුම් වලට ඇතුලත්වීම සඳහා රුපියල් 500/- ක වාර්ෂික ගාස්තුවක් අයකරනු ලැබේ. සාමාජකත්ව ප්‍රතිලාභ නිරන්තර නොවන සංචාරක මනාපය යටතේ ඇතුලත්වීමට රු. 250/- ක වාර්ෂික ගාස්තුවක් අයකරනු ලැබේ.

3.2 වැඩසටහනට සහභාගිවීම සඳහා ගාස්තුව බැංකුව විසින් තීරණය කරනු ලැබ කලින් කලට කාඩ්පත් සාමාජකයින්ට දැනුම් දෙනු ලැබේ.

4. **ලකුණු එකතුවීම**

(නිරන්තර - සංචාරක මනාපය හා නිරන්තර - නොවන සංචාරක මනාපය යන දෙකටම අදාල වේ)

4.1 ප්‍රවර්ධන දීමනා හැරුණු විට, ඕනෑම දේශීය හෝ විදේශීය ඇමරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ් පිළිගැනීමේ ස්ථානයකදී වියදම් කරන සෑම රු. 200කටම එක ලකුණක් කාඩ්පත් සාමාජිකයින්ට උපයා ගත හැක. මෙය ක්‍රෙඩිට් කාඩ් පහසුකමත් සමඟ එනු ලබන මුදල් අත්තිකාරම් සහ ගාස්තු සඳහා අදාල නොවේ.

4.2 ආපසු භාරදෙන ලද භාණ්ඩ හෝ සේවාවන්ගෙන් හෝ බිල්ගත කිරීමේ හබ වලින් උද්ගත වන යම් ණය වේ නම් වැඩසටහනේ උපයාගත් ලකුණු වලට සැකසීම් කරනු ලැබේ.

4.3 වැඩසටහන් ගිණුමේ එකතු වූ ලකුණු කාඩ්පත් සාමාජකයන්ගේ දේපළ නොවන අතර නීතිය ක්‍රියාත්මක කිරීමෙන් වේවා හෝ වෙනත් ආකාරයෙන් වේවා වෙනත් යම් පුද්ගලයකුට පැවරිය නොහැකිය. ඒවා සහභාගි වන නිරන්තර සංචාරක පාර්ශවකරුවන්ට හෝ කඩ්පත් සාමාජකයාගේ අදල වන පරිවර්තන රේට් ප්‍රමාණය සහිත යම් ගිණුමට පැවරිය හැකිය.

4.4 වැඩසටහන් ගිණුමේ එකතු වූ ලකුණු වලට මුදල් හෝ මූල්‍යමය වටිනාකමක් නැත.

5. **ලකුණු වල කාලය ඉකුත්වීම**

වැඩසටහනට සහභාගිවන අතර තුර ලකුණු වල කාලය ඉකුත්වීමක් නැත. දැනටම එකතු වී ඇති හෝ ඉන් අනතුරුව එකතු වන ලකුණු සඳහා කල් ඉකුත්වීමේ දිනයක් නියම කිරීමේ අයිතිය බැංකුව තමා වෙත රඳවා ගනී.

6. **එකතු වූ ලකුණු පිලිබඳව දන්වීම.**

කාඩ්පත් ප්‍රකාශයේ දිනයට එකතු වූ ලකුණු බැංකුව විසින් මාසික ගිණුම් ප්‍රකාශය මගින් කාඩ්පත් සාමාජකයාට දැනුම්දෙනු ලැබේ. ස්ථිර අවසාන ගිණුම් ප්‍රකාශයේ ඇති ලකුණු නිදහස් කර ගැනීමට කාඩ්පත් සාමාජකයාට හැකිය.

7. **නිදහස් කර ගැනීම සඳහා ලකුණු.**

7.1 යහපත් ස්ථාවරයක් පවතින (එනම් යුතුකම් පැහැර නොහරින) කාඩ්පත් ගිණුම් පමණක් නිදහස් කර ගැනීම සඳහා සුදුසු වේ.

7.2 පැය 24 පුරා ක්‍රියාත්මක වන ක්ෂණික ඇමතුම් අංක: (011) 4414141 ඇමතීමෙන් හෝ (011) 4414142 අංකයට ෆැක්ස් පණිවුඩයක් එවීම මගින් සරල ලෙස ලකුණු සංඛ්‍යාව නිදහස් කර ගත හැකිය. ඔවුන්ගේ අන්තිම ගිණුම් ප්‍රකාශයේ ඇති ලකුණු ප්‍රමාණය නිදහස් කර ගැනීම පමණක් කාඩ්පත් සමාජකයින්ට කළ හැකිය.

7.3 බැංකුව ඇමතීමේදී අමතන්නා විසින් කාඩ්පත් සාමාජිකයා ලෙස හඳුනාගනු ලැබීම සඳහා ප්‍රමාණවත් තරම් තොරතුරු ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය සත්‍යාපනය කිරීමෙන් පසුව බැංකුව විසින් කාඩ්පත් සාමාජිකයාට තෑගි වවුචරයක් යවනු ලැබේ.

7.4 නිදහස් කර ගැනීම කළ කල්හි එනම් නිදහස් කරනු ලැබූ ලකුණු සංඛ්‍යාව කාඩ්පත් සාමාජිකයාගේ ගිණුමෙන් අඩුකර ගනු ලබන අතර තෑගි වවුචරය කාඩ්පත් සාමාජිකයාට හෝ/ඔහුගේ/ඇයගේ නාමිකයාට යවනු ලැබේ.

7.5 තෑගි වවුචර් කුරියර් සේවා මගින් භාරදීමට බැංකුව බැඳී නොසිටිනු ඇත.

7.6 බේරාගනු ලැබූ තෑගි වවුචරය කාඩ්පත් සාමාජිකයා විසින් ඔහු/ඇය කැමති ඕනෑම අයකුට දීමට හැකිය. තෑගි වවුචරය බැංකුව විසින් නිකුත් කර කාඩ්පත් සාමාජිකයා විසින් හෝ ඔහුගේ/ඇයගේ නාමිකයා විසින් බැංකුවේ කවුන්ටරයෙන් ලබාගෙන ඇති විට හා තෑගි ඔප්පුව භාරදීම තැපැල් කර ඇත්නම් හෝ අතින් භාරදී ඇත්නම් හෝ කුරියර් සේවයකට භාරදී ඇත්නම් යම් ආකාරයෙන් හෝ බැංකුව ඒ සම්බන්ධයෙන් වග නොකියන්නේය හෝ බැඳී නොසිටින්නේය. නැතිවූ හෝ සොරකම් කරන ලද වවුචර සම්බන්ධයෙන් බැංකුව බැඳී නොසිටින්නේය.

7.7 ප්‍රතිඵල නිරවුල් කර ගැනීමට හෝ වෙබ් අඩවියේ දක්වෙන සේවාවන් භුක්ති විඳීමට කාඩ්පත් සාමාජිකයාට හෝ ඔහුගේ/ඇයගේ නාමිකයා විසින් වවුචරය සාමාජිකයාගේ ප්‍රතිලාභ වාණිජ වෙළඳ හලට ඉදිරිපත් කළ යුතුය.

7.8 නියමිත වලංගු කාලසීමාව තුල වවුචරය සාමාජිකයන්ට ප්‍රතිලාභ පාර්ශවකරු ආයතනයට ඉදිරිපත් නොකළ හොත් කවරාකාරයෙන් හෝ බැංකුව වගකීම නොදන්නා අතර ඒ වෙනුවට ප්‍රතිස්ථාපන වවුචර් කිසිවිටක බැංකුව නිකුත් නොකරයි.

7.9 බේරා ගැනීම සඳහා ලැයිස්තුගත කර ඇති නිෂ්පාදනයන්/සේවාවන් ඒවා ලබාගත හැකිවීමට යටත්වේ නිෂ්පාදනයන්/සේවාවන් නොමැතිවීම සම්බන්ධයෙන් බැංකුව වග නොකියයි.

7.10 යම් පූර්ව දැනුම්දීමක් නොමැතිව මෙම අත්පොත් නිදහස් කරගැනීමේ මනාපය ලෙස අර්පණය කර ඇති යම් නිෂ්පාදන/සේවාවන් එකතු කිරීමට හෝ ප්‍රතිස්ථානය කිරීමට බලය බැංකුව තමා වෙත රඳවා ගනී.

7.11 වාණිජ වෙළඳහල් කිසිවකදී බේරාගන්නා ලද යම් නිෂ්පාදනයන්/ සේවාවන් පිළිබඳව බැංකුව සැපයුම්කරුවකු නොවන අතර එම නිසා එයට සැපයෙන නිෂ්පාදන/සේවාවන් පිළිබඳව යම් බැඳීමක් බැංකුව භාරනොගනී. එම නිසා සඳහන් කර ඇති යම් හෝටල් සංචාරයක නියෝජිත ආයතන/ගුවන් සේවා වල පූර්ව ඇණවුම් (bookins) සම්බන්ධයෙන් බැංකුව බැඳී නොසිටින්නේය.

7.12 බේරාගැනීමට අවශ්‍ය ලකුණු සංඛ්‍යාව පූර්ව දැනුම්දීමක් නොමැතිව වෙනස් කිරීමට යටත්වේ.

7.13 ඉදිරිපත් කර හා සකස් කර ඇති බේරාගැනීමේ ඉල්ලීම් වලට වෙනස් කම් සිදු කරනු නොලැබේ.

7.14 සීමිත වලංගු කාලසීමාවක් සහිත තෑගි වවුචර් නිකුත් කිරීමට බලය බැංකුව තමාවෙත රඳවාගනී.

7.15 තිබෙන බේරාගැනීමේ මනාපයන් ඇමරිකන් එක්ස්ප්‍රස් වෙබ් අඩවියේ (www.americanexpress.lk) ලැයිස්තු ගත කරනු ලැබේ.

8. **නිරන්තර නොවන සංචාර ප්‍රතිලාභ බේරාගැනීම**

8.1 සියලුම ප්‍රතිලාභ ඒවා තිබෙන බවට යටත් වන අතර ඇතැම් සීමා කිරීම් අදාල විය හැකිය.

8.2 යම් ප්‍රතිලාභ වලට අදාලව සිදුකරන යම් අතිරේක ආහාර වේල්, ප්‍රවාහණ සේවා හෝ නවාතැන් පිළිබඳව කටයුතු සකස් කිරීම කාඩ්පත් සාමාජිකයාගේ තනි වගකීම වන්නේය.

8.3 ප්‍රතිලාභ තෑගි වවුචරයක ස්වරූපය ගන්නා අවස්ථාවේදී තෑගි වවුචරයේ සටහන් කර ඇති වටිනාකම ඉක්මවා කාඩ්පත් සාමාජිකයා භාණ්ඩ හෝ සේවාවන් මිලදී ගන්නේ නම් කාඩ්පත් සාමාජිකයා විසින් සහභාගී සේවා ආයතනයට ගෙවීම පිහිටුවා දීම්ම හෝ අදල වෙනස ගෙවීම කළ යුතු වන්නේය.

9. **නිරන්තර සංචාර ප්‍රතිලාභ බේරා ගනීම.**

9.1 ලකුණු සංඛ්‍යාව සහභාගීත්ව නිරන්තර සංචාර පාර්ශවකරුවකු හෝ ඊට වැඩි සංඛ්‍යාවකට පරිවර්තනය කළ හැකි වන්නේය.

9.2 එකතු වූ ලකුණු විශේෂිත නිරන්තර සංචාරක වැඩසටහන් වලට පරිවර්තනය කිරීම සඳහා කාඩ්පත් සාමාජිකයා විසින් ප්‍රථමයෙන් ඇතුලත්වී අදල වැඩසටහනට සාමාජිකයකු ලෙස ඇතුලත් විය යුතුය එවැනි වැඩසටහන් වලට ඇතුලත්වීම කාඩ්පත් සාමාජිකයාගේ වගකීම් වන්නේය.

9.3 සහාභාගි නිරන්තර සංචාර වැඩ සටහන සඳහා යම් එකතු වූ ලකුණු වල පරිවර්තනය රේට් ප්‍රමාණය සහභාගි වන නිරන්තර සංචාරක වැඩසටහන් වල පාර්ශවකරුවන් අතර වෙනස් වන අතර විස්තර බැංකුවේ හුදු අභිමතය ප්‍රකාර වෙනස් විමට යටත් වේ.

9.4 ඔවුනොවුන් ඇතුලත්වී ඇති අදල නිරන්තර සංචාරක වැඩසටහන් වල නියමයන් හා කොන්දේසි වලට කාඩ්පත් සාමාජිකයින් යටත් විය යුතු අතර ඒවාට අනුකුල විය යුතුය.

9.5 කාඩ්පත් සාමාජික වැඩසටහන් ගිණුමකින් සහභාගි නිරන්තර සංචාරක වැඩසටහනකට හෝ යම් සහභාගී ගුවන් සේවයක කටයුතු සඳහා හෝ එහි වෙනත් ආකාරයෙන් ලකුණු පරිවර්තනය කිරීම වෙනුවෙන් බැංකුව වගකීම් නොදරයි.

9.6 යම් ගුවන් සේවා හෝ හෝටල් සහභාගිත්වය දැනුම්දී හෝ නොදී වෙනස් විමට යටත් වේ.

9.7 නිරන්තර ගුවන් ගමන් ටිකට්පත් හෝ මැකිනොන් ට්‍රැවල් වවුචර් හා කාඩ් සාමාජක වැඩ සටහනකින් පරිවර්තනය කරන ලද ලකුණු පාවිච්චි කරමින් ලබාගත් නිරන්තරව ගුවන් ගමන් ටිකට්පත් වලින් කරනු ලබන ගුවන් ගමන් වලට බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත් සංචාරක රක්ෂණ ප්‍රතිලාභ අදල නොවන්නේය.

9.8 මැකිනොන් ඇමරිකන් එක්ස්ප්‍රස් ට්‍රැවල් හිදී බේරාගත හැකි සංචාරක වවුචර් සම්බන්ධයෙන් පහත දැක්වෙන නියමයන් හා කෙන්දේසි අදල වන්නේය.

9.8.1 සංචාරක වවුචර් මැකිනොන්ස් ට්‍රැවල්ස් හිදී පමණක් බේරාගත හැකි අතර නිකුත්වන දිනයේ සිට මාස 3ක් සඳහා එය වලංගු වන්නේය.

9.8.2 සංචාරක වවුචර සඳහා ආපසු ගෙවීම් කළ නොහැකිය ඒවා මුදල් වලට හුවමාරු කල නොහැකි අතර වෙනත් ප්‍රවර්ධන වැඩසටහන් හෝ අර්පණයක් සමග එක්ව භාවිතා කළ නොහැකිය. බේරාගැනීමේ අර්පණය නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ, ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ්පත් හා ඒවායේ ඒ ඒ ආයතන වල නියමයන් හා කොන්දේසි වලින් බැඳී පවතී.

9.8.3 සංචාරක වවුචර් යොදාගෙන අර්ධ ගෙවීම් කිරීමේදී ශේෂය ගෙවිය යුත්තේ ඇමරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පතක් භාවිතා කරමින්ය.

9.8.4 ගුවන් ගමන් හෝ බුකින් අවලංගු කිරීමකදී කාඩ් සාමාජිකයාට යම් ගෙවීමක් කළ යුතු වේ නම් මැකිනොන්ස් ට්‍රැවල්ස් විසින් එම ගෙවීම කළ යුතුය.

9.8.5 සංචාරක වවුචර් යොදගෙන ඔවුන්ගේ ටිකට්පත් මිලදී ගත් විට කාඩ්පත් සමාජිකයින් සංචාරක රක්ෂණයට හිමිකම් නොලබති.

9.8.6 (i) යම් රක්ෂණ (ii) ගුවන් තොටුපොල මාරුවීමේ ගාස්තු (iii) ගුවන් තොටපොල බදු හා (iv) ඉන්ධන අධිභාර හා බදු අයකිරීමේ සම්බන්ධයෙන් කාඩ්පත් සාමාජිකයා හුදෙක් සම්පූර්ණ වගකීම දරන්නේය.

9.8.7 නැතිවූ හෝ සොරකම් කරනු ලැබූ සංචාරක වවුචර සම්බන්ධයෙන් නේෂසන් ට්‍රස්ට් බැංකුව වගකීම නොදරයි.

9.9 ලකුණු ඒෂියා මයිල්ස් වැඩසටහනට මාරු කිරීම සම්බන්ධයෙන් කාඩ්පත් සාමාජිකයකු විසින් බේරා ගැනීමේ එක් ගනුදනුවක් සඳහා එම්ආර් ලකුණු ක 1000 ක අවමයක් පැවරිය යුතු අතර ඉන් පසුව ලකුණු 100 යේ ගුණිතයෙන්ගෙන් පැවරිය යුතුය

10. වැඩසටහන් ගිණුම.

10.1 කාඩ්පත් ගිණුමක් හෝ යම් සම්බන්ධිත ගිණුමක් යහපත් ස්ථාවරයක් නොවේනම් (යුතුකම් ඉටු නොකරන) කාඩ්පත් සාමාජිකයාගේ නිරන්තර සංචාරක වැඩසටහනට ඇතුලත්වීම අවලංගු කරනු ලැබිය හැකිය හෝ වැඩසටහන් ගිණුමේ එකතු වූ ලකුණු අහිමිකරනු ලැබිය හැකිය.

10.2 කාඩ්පත් ගිණුමට හෝ වැඩසටහන පාලනය කරන නියමයන් හා කොන්දේසි වලට අනුකූල වීමට කාඩ්පත් සාමාජිකයා අපොහොසත්වීම හේතුවෙන් කාඩ්පත් සාමාජිකයා නිරන්තර සංචාරයක වැඩසටහනට ඇතුලත් වීම අවලංගු කරන ලැබිය හැකි නැතහොත් වැඩසටහන් ගිණුමේ එකතු වූ ලකුණු අහිමිකරනු ලැබිය හැකිය.

10.3 කාඩ්පත් සාමාජිකයෙක් සියලුම ප්‍රාථමික කාඩ්පත් අවලංගු කරන්නේ නම් හෝ යම් හේතුවක් නිසා බැංකුව විසින් යම් සම්බන්ධිත ගිණුම් අවලංගු කරන්නේ නම් වැඩසටහන් ගිණුමේ එකතු වූ ලකුණු බැංකුවේ අභිමතය ප්‍රකාර නතර කිරීමට හා් බේරා යැවීමට නොහැකිවන්නේය. කාඩ්පත් සාමාජිකයා යම් කාඩ්පත් ගිණුමක් නැවත ස්ථාපනය කරන්නේ නම් හෝ අවලංගු කිරීමෙන් අනතුරුව එක් එක් වසරක් ඇතුලත සම්බන්ධිත ගිණුම් බැංකුව විසින් නැවත ස්ථාපනය කරනුයේ නම් කාඩ්පත් සාමාජිකයාගේ වැඩසටහනක ගිණුමේ එකග වූ යම් ලකුණු සහභාගී නිරන්තර සංචාර වැඩ සටහනට පරිවර්තනය කළ හැකිය හෝ වැඩසටහනේ නියමයන්ට හා කොන්දේසි වලට යටත්ව ප්‍රතිලාභ සඳහා බේරා ගත හැකිය.

10.4 එකී ප්‍රාථමික ගිණුමකට වඩා ධන සුදුසුකම් ඇති කාඩ් පත් සමාජිකයකු ස්වෙච්ඡාවෙන් එවැනි යම් කාඩ්පත් ගිණුම් අවලංගු කර යටත් පිරිසෙන් එක් ප්‍රාථමික ගිණුමක් ඉතිරි වී තිබේනම් අවලංගු කරන ලද කාඩ්පතට බිල්ගත කළ ගාස්තු වල ප්‍රතිඵලයක් වශයෙන් වැඩ සටහනේ එකතුවී ඇති යම් ලකුණු ඔහුගේ/ඇයගේ නමින් ඉතිරිව තිබෙන කාඩ්පත් ගිණුමට පැවරිය හැකිය.

## 11. පොදු

11.1 නිරන්තර සංචාර හෝ නිරන්ත නොවන සංචාර ප්‍රතිලාභ බේරා ගැනීම හේතුවෙන් සිදුවන කවරාකාර හෝ යම් අලාභ සම්බන්ධයෙන් බැංකුව වගකීම භාර නොගනී.

11.2 අදාල අවස්ථාවකදී අවශ්‍ය යැයි බැංකුවට හැගෙන ඕනෑම වේලාවකදී වැඩසටහනක් නතර කිරීමට හෝ සමාප්ත කිරීමට බැංකුවට හැකි වේ.

11.3 වැඩසටහන් කොන්දේසි හා නියමයන් ඕනෑම වේලාවකදී වෙනස් කිරීමේ අයිතියි බැංකුව තමාවෙත රඳවාගනී.

11.4 සහභාගී නිරන්තර සංචාර වැඩ සටහනට ලකුණු පැවරීම ඇතුළුව වැඩසටහනේ ලකුණු උපයා ගැනිමට හෝ ප්‍රතිලාභ බේරාගැනීමට අදලව වංචාව හා දෝෂාරෝපණය හේතුවෙන් එකතු වී ඇති ලකුණු අහිමිවීමේ මෙන්ම කාඩ්පත් සාමාජිකයාගේ වැඩසටහන් ගිණුම අවලංගු කිරීම සිදුවිය හැකිය.

11.5 වැඩසටහන යොග්‍යතාවය සම්බන්ධයෙන් හෝ සහභාගී නිරන්තර සංචාරක වැඩසටහනකට ලකුණු පැවරීම ඇතුලුව ප්‍රතිලාභ එකගවීම හෝ බේරා ගැනීමට යොග්‍ය ලකුණු සම්බන්ධයෙන් සියලු ප්‍රශ්න හා හබයන් බැංකුව විසින් එහි හුදු තනි අභිමතය ප්‍රකාර තීරණය කරනු ලැබේ.

11.6 වැඩ සටහන් ගිණුම පැවරිය නොහැකිය.

11.7 යම් විශේෂිත නියමයක් හෝ කොන්දේසියක් ක්‍රියාත්මක කිරීමට බැංකුව අපොහොසත්වීම යනුවෙන් බැංකුව එම නියමයන් හෝ කොන්දේසිය අත්හැර දැමීමක් ලෙස සංස්ථාපනය නොකරේ.

11.8 කිසියම් සහභාගී නිරන්තර සංචාරක වැඩසටහකට ලකුණු පැවරීම ඇතුළුව වැඩසටහනේ යම් ප්‍රතිලාභයක් එකතු වූ ලකුණු සාමාජිකයකුගේ වැඩසටහන් ගිණුමක එකතු වූ ලකුණු බේරාගනු ලැබූ

ට්ට එනම් ආපසු ගෙවීම් කල නොහැකිය හෝ ඒවා කාඩ්පත් සාමාජිකයාගේ වැඩසටහන් ගිණුමට ආපසු පැවරිය නොහැකිය.

11.9 වැඩසටහන් යටතේ ප්‍රතිලාභයක් වශයෙන් ලැබුණු භාණ්ඩ හෝ සේවාවන් සම්බන්ධයෙන් යම් හබයක් කාඩ්පත් සාමාජිකයා හෝ භාණ්ඩ හා සේවාවන් සැපයූ සේවා ආයතන අතර නිරවුල් කර ගනු ලබන්නේය. එවැනි හබ ගැන තීරණය කිරීම හෝ හුදෙක් හබයට සම්බන්ධයෙන්ම බැංකුව වගකීම නොදරයි.

11.10 සාමාජිකත්ව ප්‍රතිලාභ වැඩසටහන් සම ඒකාබද්ධව විශේෂ අර්පණයන් සම්බන්ධයෙන් කලින් කලට සන්නිවේදනය කරන තැපැලෙන් එවන ලිපි කෙලින්ම ලබාගැනීමට කාඩ්පත් සාමාජිකයා එකග වෙයි.

11.11 යම් ගණුදෙනුවක් සම්බන්ධයෙන් හබ වුවහොත් හෝ ආපසු හරකර ඇත්නම් හෝ යම් හේතුවක් නිසා අවංලගු කර ගනුදෙනුවකින් එකතු වන ලකුණු බැංකුව විසින් යලිත් අවලංගු කරනු ලැබේ.

11.12 කිසියම් ගනුදෙනුවක් සිද්ධි කර සහ ලකුණු බේරා ඇතොත් සහ ඉන්පසුව හබයක්/හෝ ගනුදෙනුව අවංගු කිරීමක් සිදුවී ඇත්නම් ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට හෝ නේෂන්ස් ට්‍රස්ට් සමග අදල කාඩ්පත් සාමාජිකයා පවත්වා ගෙන යන ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමකට හෝ වෙනත් යම් ගිණුමකට බැර කිරීටමත් එකී ගනුදෙනුව වෙනුවෙන් බේරාගත් වැඩිපුර ලකුණු වල සමාන රුපියල් ප්‍රමාණය අයකර ගැනීමේ අයිතිය බැංකුව රදවා ගනී. එවැනි අවස්ථාවකදී හිමිකම් දක්වීමක් ඉදිරිපත් වුවහොත් කාඩ්පත් සාමාජිකයාගේ ප්‍රකාශයේ දක්වා ඇති ඊළග ගෙවීම් මගින් එවැනි මුදල් ගණන් පියවා දැමීමට කාඩ්පත් සාමාජිකයා එකග වෙයි.

11.13. හුදෙක් ස්වකීය අභිමතය ප්‍රකාර වෙනත් පාක්ෂික භාවයක්/ප්‍රතිලාභයක්/සැතපුම් වැඩසටහනක් සමග සම්බන්ධ වීමට අයිතිය බැංකුව තමා වෙත රදවා ගනී.

11.14 ප්‍රතිලාභ ලකුණු ඉපයීම හා එක්රැස් කිරීම හෝ බේරා ගැනීමේ නියෝග සම්බන්ධයෙන් වංචාවක් හෝ එවැනි යම් ප්‍රයත්නයක් හේතුවෙන් කාඩ්පත රදවා ගනු ලැබීම/අවලංගු කිරීමට අමතරව එකතු ප්‍රතිලාභ ලකුණු අහිමි කිරීම සිදුවේ.

11.15 කාඩ්පත් සාමාජිකයකු ඔහුගේ කාඩ්පත් ගිණුම අවලංගු කිරීමට තීරණය කරන්නේනම් උපයාගත් සියලු ලකුණු අහිමි කරනු ලබන්නේය.

11.16 වැඩසටහනේ යම් හබයක් උද්ගතවුවහොත් බැංකුවේ තීරණය අවසානාත්මක වන්නේය.

11.17 පූර්ව දැනුම්දීමකින් තොරව, වැඩසටහන පවතින කාල සීමාව තුල ඕනෑම අවස්ථාවකදී සහ වේබ් අඩවියේ ලැයිස්තු ගත කර ඇති සාමාජිකයන්ට පාර්ශවකරු ආයතනයට තවත් එකතු කිරීමට හෝ එය ඉවත් කිරීමට බැංකුව බලය රදවා ගනී.

12. පාලනය කරන නීතිය.

මෙකී නියමයන් හා කොන්දේසි ශ්‍රී ලංකා නීතිය මගින් පාලනය වේ.